**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 09 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ බිල්කල කඩකුලී ආදායම රු.645,600 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ ආදායම රු.700,831 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.55,231 ක් වැඩියෙන් දක්වා තිබුණි. | සමලෝචිත වර්ෂයට අදාල බිල්කල ආදායම පමණක් ආදායම් වියදම් ගිණුමට ගතයුතු අතර පෙර වර්ෂවලට අදාල ලැබීම් සහ වර්ෂයට අදාල ලැබීම් වෙන වෙනම හඳුනා ගත හැකි ආකාරයට ලේඛන නඩත්තු කළ යුතුවේ. | 2018 වර්ෂයේ කඩකුලී සඳහා බිල්කල ආදායම රු.645,600 ක් වුවද, පසුගිය වර්ෂවල අය නොවුන හිඟ කඩකුලී සඳහා අයකළ ප්‍රමාද ගාස්තු රු.55,231ක මුදලද මෙම ගිණුමෙහි ගිණුම්ගත කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කල යුතු වේ. | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් රු.100,000 ක මුදලක් අයවැය ලේඛනයෙන් වෙන්කර ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ මුද්දර බදු ආදායම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | අදාල ආයතන වලින් විමසීම් කර අයවිය යුතු ආදායම හඳුනාගෙන වර්ෂයට අදාල ආදායම් ගිණුම්ගත කළ යුතුවේ. | රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු මුද්දර ගාස්තුව ගණනය කර සභාව වෙත දැනුම් දෙනු ලබන්නේ ඊට පසු වර්ෂයේදීය. |

| | | | |
|---|---|---|---|
| | | | 2018.03.31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස්කර අවසන්වන විටදී එම මූල්‍ය අගය සභාව වෙත ලැබී නොතිබිණි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.39,040,932 ක් වූ ගිණුම් ශේෂ 2 ක් උපලේඛන සහ වාර්තාවල රු.39,040,989 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.60,049 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පෙන්වා දී ඇති ගණනය කිරීම් වල වෙනස සිදුවී ඇත්තේ පරිගණකගත කිරීමේදී සිදුවී ඇති ප්‍රමාද දෝෂයක් හේතුවෙනි |
| (ii) | ප්‍රාදේශීය සභාවේ ස්ථාවර වත්කම් ලේඛනයේ රු.3,584,700 ක් ලෙස දැක්වෙන මෝටර් රථ හා කරත්තවල වටිනාකම සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ රු.11,437,366 ක් ලෙස දක්වා තිබුණු බැවින් වත්කම්වල වටිනාකම රු.10,066,526 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන වටිනාකම්වලට අදාල නිවැරදි තොරතුරු තහවුරු කර ගැනීමෙන් අනතුරුව 2019 දෙසැම්බර් 31 දිනට සකස් කරන මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කරගනිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාහන කුලියට ලබාදීමෙන් උපයා තිබූ ආදායම අදාල ගිණුමේ රු.934,861 ක් ලෙස දක්වා තිබුණද අදායම් උපලේඛන අනුව රු.246,000 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.688,861 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | වාහන වලින් ලැබුණු ආදායම යාවත්කාලීන කිරීමට විෂයභාර නිලධාරීට උපදෙස් ලබාදුනිමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 04 සිට 05 දක්වා කාලපරිච්ඡේදයක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබුණු රු.931,791 ක ගිණුම් ශේෂ 7 ක් | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත්කර ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ උපදෙස් ලබාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | | |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පූර්ව වර්ෂ 03 සිට 05 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබුණු රු.1,710,681 ක ගිණුම් ශේෂ 5 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | එම ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවතකර ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ උපදෙස් ලබාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.71,986,857 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාලව වත්කම් ලේඛන, හිමිකම් සහතික, වයස් විශ්ලේෂණ සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා වටිනාකම් සනාථ කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම අනුව වාහන කුලියට ලබාදී මෙන් උපයාගෙන තිබුණු ආදායම රු934., 861ක් ලෙස දක්වා තිබුනද එම ආදායම තහවුරු කර ගැනිමට විධිමත් ලේඛන සහ වාර්තා සභාව විසින් නඩත්තු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආදායම තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | වාහන කුලියට ලබාදීම සඳහා අදාල ලේඛන නිවැරදිව විධිමත්ව පවත්වාගෙන යාමට විෂයභාර නිලධාරීට උපදෙස් ලබාදුනිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාලව රු.76,737,005 ක වටිනාකමකින් යුතු ජ්නල සටහන් වලට අදාල ශේෂයන් තහවුරු කර ගැනීමට අදාලව තොරතුරු ඉදිරිපත් නොවීය. | විධිමත් අනුමැතියක් ලබාගෙන ජ්නල් සටහන් තැබීමට කටයුතු කළ යුතුවේ. | විගණන විමසුම සඳහා අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට අපහසුවී ඇත. |

1.4 අනුකූල නොවීම

--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| | නීති,රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| (i) | රීති 33 | වරිපනම් ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු එක් එක් කාර්තුව අවසානයේදි පිළියෙල කර නොතිබුණි. | රීති අනුව කටයුතු කළයුතු වේ. | එක් එක් කාර්තුව අවසානයේදී ලේඛනය තුලනය කරනු ලබයි. එහි ශේෂය අනුව මුදල් අයකරගැනීමට කටයුතු කරනු ලබන අතර, මෙතෙක් මෙම ප්‍රාදේශිය සභාව දේපළ තහනම් කිරීමක් සිදුකර නොමැත. |
| (ii) | රීති 217 හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රා.ස 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරික්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කළයුතු වේ. | අදාල චක්‍රලේඛ අනුව ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 1645 | සභාවේ වාහනවලට අදාලව එක් එක් මාසයේ ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊලග මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතු වේ. | ධාවන සටහන් හා මාසික සාරාංශය සකස් කිරීමෙන් අනතුරුව රියදුරු මහතුන් දැනුවත් කර ඇත. ඒ අනුව ඉදිරියේදී නියමිත දිනට වාර්තා ඉදිරිපත් කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 07 ක් සම්බන්ධව ඉන්ධන පරීක්ෂාවක් කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු වේ. | තාක්ෂණ නිලධාරි දැනුවත් කර ඇත. ඉදිරියේදී නිවැරදි ක්‍රමවේදය අනුගමනය කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු වේ. | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.928,671 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.913,037 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,141,878 | 1,147,957 | 1,132,622 | 735,092 | 919,058 | 1,033,378 | 313,621 | 719,757 |
| කුලී | 4,568,450 | 3,245,355 | 3,466,439 | 1,392,347 | 4,120,800 | 2,756,850 | 1,143,419 | 1,613,431 |
| බලපත්‍ර ගාස්තු | 2,237,460 | 1,528,185 | 1,528,185 | 66,040 | 1,530,375 | 1,126,848 | 1,060,808 | 66,040 |
| වෙනත් ආදායම් | 23,753,771 | 20,192,863 | 19,610,441 | 3,055,303 | 22,042,000 | 16,265,507 | 13,792,626 | 2,472,881 |
| එකතුව | 31,701,559 | 26,114,360 | 25,737,687 | 5,248,782 | 28,612,233 | 21,182,583 | 16,310,474 | 4,872,109 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශයේ දේපල 146 කින් අයවිය යුතුව පැවතුණු රු.248,422 ක වරිපනම් බදු මූල්‍ය හා පරිපාලන රීති 32 - 42 ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මුළු හිඟ මුදලින් රු. 52,192 ක මුදල ප්‍රාදේශිය සභා ගොඩනැගිලි වලින් අයවිය යුතු හිඟ මුදල් වේ . මෙම මුදල ඉදිරියේදී මහ සභා අනුමැතිය ඇතිව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. ඉතිරි හිඟ මුදල් මෙම වර්ෂයේදී අයකිරීමට කටයුතු කරමි. |

2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණු හිඟ කඩකුලී ආදායම රු.1,794,360 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019.05.13 දින වනවිට මෙම හිඟ මුදලින් රු. 320,982 ක මුදලක් අයකරගෙන ඇත. ඉතිරි හිඟ මුදල් 2019.05.31 දින වනවිට ගෙවා අවසන් කරන මෙන් දන්වා කඩ හිමියන් වෙත ලිපි නිකුත් කර ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා,විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු | අතුරු ව්‍යවස්ථා පනවා සභාවේ කටයුතු කාර්යක්ෂමතාවය සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන ආයතනය අතුරු ව්‍යවස්ථා සකස් කර ගැසට් කිරීමෙන් අනතුරුව වැළඳගැනීමෙන් පසු, එම අතුරු |

| | | |
|---|---|---|
| ව්‍යවස්ථා පනවා නොතිබුණි. | | ව්‍යවස්ථා අනුගමනය කිරීමට කටයුතු කරමි. |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම
-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී සකස් කිරිමට කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව සමාලෝචිත වර්ෂය තුලදීද දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 අනුව කටයුතු කළ යුතුවේ. | මෙම වැඩසටහන යටතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් මුදල් සභාව සතු නොවීමත් අඩු ආදායම් සභාවක් වීමත් නිසාත් මෙම සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ජේදය තුලදී සහ සභාව මිලට ගෙන සහ සභාව සතුව තිබුණු රු.71,390,690 ක්වූ වත්කම් හඳුනාගෙන නොතිබුණු අතර එම වත්කම්වල භෞතික පැවැත්ම අනාවරණය නොවීය. | අදාල වටිනාකම්වලට අදාල වත්කම් සහ ඒවායේ භෞතික පැවැත්ම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පැරණි මූලා ප්‍රකාශන තුලින් පෙන්නුම් කරන මෙම ශේෂය සඳහා උපලේඛන සොයාගත නොහැක. 2015 වර්ෂයේදී පුර නැගුම ව්‍යාපෘතියේ ලැබුණු වත්කම් පමණක් ගිණුම්ගත කර තිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව රු.214,773,794 ක වටිනාකමකින් යුතු ජ්නල සටහන් 58 ක් සඳහා කිසිදු අනුමැතියක් ලබානොගෙන ගිණුම්ගත කර තිබුණු අතර ඒ අනුව ගිණුම් තැබීමේ කටයුතු පිළිබඳව වගකිවයුතු නිලධාරීන් නිසි අධීක්ෂණයන් සිදුකර නොතිබුණි. | සියළුම ජ්නල සටහන් සහතික කලයුතු අතර සනාථ කිරිමට අදාල සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී ජ්නල් සටහන් සඳහා අනුමැතිය ලබාගත යුතු බව සහකාර ගිණුම් නිලධාරිනිය දැනුවත් කරන ලදී. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ සේවක පුරප්පාඩු තනතුරු 11 ක් පැවති අතර අතිරික්ත තනතුරු 03 ක් විය. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනිමට කටයුතු කළ යුතුවේ. | අතිරික්ත තනතුරු 03 ක් සඳහා සේවකයින් සිටිනුයේ 2017 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරිමේදි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් හා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු කර ඇති සේවකයින් බව දන්වා සිටිමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### වත්කම් ලේඛනගත නොකිරිම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වාහන 03 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනිමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභා පරිශ්‍රයේ රඳවා තිබෙන වාහන 06 ක් අක්‍රිය තත්වයේ පවතින අතර මෙම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනිමට හෝ මුදල් අමාත්‍යාංශයේ 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර භවිතයට ගැනිමට හෝ අපහරණය කිරිමට කටයුතු කළ යුතුවේ. | සභා යතුරුපැදිය සහ ට්‍රැක්ටරය මෙම වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් වීමෙන් පසු තාක්ෂණ ඇගයීම කමිටුවට ඉදිරිපත් කර තක්සේරුවක් ලබාගෙන ඇවර කටයුතු කරන බවද ත්‍රීරෝද රථය , ජ්ලේට් රෝල, යාන්ත්‍රික ඉංජිනේරු අධික්ෂණයට ඉදිරිපත් කර අළුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 ජනවරි 28 දිනැති අංක DMA/2009(1)(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුවේ. | DMA/2009(1)(i) දරන මුදල් අමාත්‍යංශ චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටුවක් පත්කර ගැනිමට කටයුතු කරමි. |